මෙම කොටස සඳහා වෙනම පිළිතුරු පොතක් භාවිත කළ යුතු ය. එහි විෂය ලෙස ලිවිය යුත්තේ **"ව්‍යාපාර නීතිය"** යන්න පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අන්තර්මධ්‍ය විභාගය - 2011 ජූලි**

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**ව්‍යාපාර නීතිය**

(Business Law)

2011-07-31
පෙරවරු
[9.00 – 10.30]

**කාලය: පැය 1 විනාඩි 30 යි.**

පිටු ගණන: 02
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

  *(1) මෙම ප්‍රශ්න පත්‍රය **ව්‍යාපාර නීතිය හා කළමනාකරණය** යන විෂයයේ **ව්‍යාපාර නීතිය** කොටස යි.*

  *(2) **ඕනෑම ප්‍රශ්න පහක (05) ට උත්තර ලියන්න.***

  *(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාළව, එක් **භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*

  *(4) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය විෂයය සමත් වීම සඳහා, අයදුම්කරුවකු, ව්‍යාපාර නීතිය මෙන්ම කළමනාකරණය යන එක් එක් කොටසට, අවස්ථාවෝචිත පරිදි, 40% හෝ 50% බැගින් වූ අවම ලකුණු මට්ටමක් ලබාගත යුතු ය.*

  *(5) ලකුණු 50.*

---

**01.** (a) අභියාචනාධිකරණය විසින් නිකුත් කරනු ලබන රිට් ආඥා වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

(b) රෝම ලන්දේසි නීතියට යටත් නොවන පුද්ගල කණ්ඩායම් දෙකක්(02) සඳහන් කරන්න.

(c) ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් දෙකක්(02) සඳහන් කරන්න.

(d) ප්‍රතිදේය පත්‍රක (negotiable instruments) වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

(e) රජයේ ප්‍රධාන නීති නිලධාරියාගේ නිල ධූර නාමය සහ අධිකරණයේ ප්‍රධානියාගේ නිල ධූර නාමය සඳහන් කරන්න.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 10)

**02.** (a) ගිවිසුම් නීතිය ඇසුරෙන් "අර්පනය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 03)

(b) පහත සඳහන් ගිවිසුම නීත්‍යානුකූල වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

"ශ්‍රී ලංකාවට අනවසරයෙන් ගෙන්වන ලද භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ගිවිසුමක්."

(ලකුණු 03)

(c) පහත සඳහන් දෑ කෙටියෙන් විස්තර කරන්න.

(i) නිරූපිත ලෙස ඉටු කිරීම (Specific Performance).

(ii) අවනිදේශනය (Misrepresentation). (ලකුණු 04)

(මුළු ලකුණු 10)

03. (a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ "නැති අයිතියක් දිය නොහැකිය" (Nemo Dat Quod Non Habet) යන රීතිය පැහැදිලි කර එම රීතියට අදාල වන ව්‍යතිරේක දෙක(02) සඳහන් කරන්න.

(ලකුණු 05)

(b) සන්තරණයෙහිදී නැවැත්වීමේ අයිතිය (stoppage in transitu) විකුණුම්කරු විසින් ක්‍රියාත්මක කළ හැක්කේ කවර කොන්දේසි යටතේද? (ලකුණු 05)

(මුළු ලකුණු 10)

04. "චෙක්පතක් යනු බැංකුවක් වෙත නිකුත් කෙරෙන, ඉල්ලූ විටෙක ගෙවිය යුතු විනිමය බිල් පත්‍රයකි. එහෙත් චෙක්පතක් සහ විනිමය බිල්පත්‍රයක් අතර වෙනස්කම් ඇත".

චෙක්පතක් සහ විනිමය බිල්පත්‍රයක් අතර ඇති වෙනස්කම් හතරක්(04) පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. නියෝජ්‍යාත්වය ඇතිවන ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. පහත සඳහන් එක් එක් ඇ කෙටියෙන් පැහැදිලි කරන්න:

(a) වෘත්තීය සමිතිය (Trade Union).

(b) වැඩ වර්ජනය (Strike).

(c) සාමූහික ගිවිසුම (Collective agreement).

(d) පිට ලෑම (Lock out).

(එකකට ලකුණු 2½ බැගින් මුළු ලකුණු 10)

- o0o -